# දිළිඳුකම පිටු දැකීමට තිරසර ප්‍රවේශයක්
# ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
# ඇසුරින් අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUD
RECEIVED
13 JAN 2014
UNIVERSITY OF KELAN

පී. වී. කුමාරසිරි වික්‍රමනායක
(FGS/G/MSSC/2006/01)



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 861 |
| වර්ග අංකය: | |



කැළණිය විශ්ව විද්‍යාලයේ සාමාජීය විද්‍යා පීඨයේ භූගෝල විද්‍යාව
පිළිබඳ සාමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා
ඉදිරිපත් කරන ලදී.

2010 වර්ෂය

## නිබන්ධනයේ සාරාංශය

''දිළිඳුකම පිටුදැකීම සඳහා තිරසර ප්‍රවේශයක්- ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් අධ්‍යයනයක්'' මැයෙන් වූ මෙම පර්යේෂණය තුළින්, දිළිඳුකම, දිළිඳුකම ඇතිවීමට හේතු, දිළිඳුකමේ මූලික ලක්ෂණයන්, දිළිඳුකමේ බහුවිධ පැතිමාණයන් හා දිළිඳුකම නිසා සිදුවන පාරිසරික ව්‍යවසනයන් හඳුනා ගැනුනි. පර්යේෂණය සඳහා ප්‍රාථමික දත්ත, ව්‍යුහගත ප්‍රශ්නමාලා, සහභාගිත්ව නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා මගින් ද, ද්විතීක දත්ත දරිද්‍රතාවය පිළිබඳ ලියවී ඇති ලිඛිත මූලාශ්‍රයන් ඇසුරෙන් ද ලබා ගැනුනි. මෙකී දත්ත සංඛ්‍යාන විද්‍යාත්මක නිර්මිතීන් භාවිතයෙන් තාර්කික විශ්ලේෂණයන් සඳහා භාවිතයට ගැනුනි. දරිද්‍රතාවය හිමිකම් අහිමි වීමෙන් ඇතිවන සංකීර්ණ සංසිද්ධියකි. දරිද්‍රතාව ඇතිවීම කෙරෙහි අඩු අධ්‍යාපනය හා නුගත්කම, අඩු ආදායම හෙවත් අඩු වත්කම, අසමගිය සහ අසංවිධානාත්මක බව, අඩු පෝෂණය සහ අඩු සෞඛ්‍ය තත්ත්වය, දේශපාලන හා සමාජ ශක්තිය හීන වීම යන සාධකයන් බලපෑම්කොට තිබේ. හුදකලා බව, අඩු ආදායම, අඩු අධ්‍යාපනය, ස්ව ශක්තිය හීනවීම හා ඍණාත්මක ආකල්ප, කාන්තාවන්ට පුරුෂයින් විෂයෙහි ලා සම තත්ත්වය නොලැබීම, අන්ධ විශ්වාස හා මිත්‍යා මත, සහනාධාර මානසිකත්වය, කම්මැලිකම, ජාති, ආගම්, කුලභේදය, වගකීම් හා අවදානම් දැරීමට ඇති මැළිකම, මත්ද්‍රව්‍ය හා දුම්වැටි වලට ඇබ්බැහි වීම දරිද්‍රතාවයේ මූලික ලක්ෂණයන්ය. අධ්‍යාපනය දරිද්‍රතා රේඛාවට පහළ ජන කොටස්වල ආදායම කෙරෙහි ධනාත්මක බලපෑම් කරයි. ආදායම දරිද්‍රතාවය කෙරෙහි ඍණාත්මක බලපෑම් කරයි. අඩු අධ්‍යාපනය දිළිඳුකමට ප්‍රධාන ම හේතුවයි. සේවා නියුක්තියේ බහුවිධ පැතිමාණයන් අනුව ද දරිද්‍රතාවයේ විවිධතා හඳුනාගත හැකිය. දිළින්දන් බොහෝ දෙනෙකුට පදිංචි ඉඩම පිළිබඳව නිශ්චිත හිමිකමක් නැත. ජල හා සනීපාරක්ෂක පහසුකම් පහත් මට්ටමක පැවතුණි. දිළිඳු පුද්ගලයන් මත්ද්‍රව්‍ය, දුම්වැටි, බුලත්විට සඳහා දෛනිකව උපයන මුදලින් සැලකිය යුතු මුදලක් අනවශ්‍ය ලෙස වියදම් කරති. දිළිඳුකම පිටුදැකීම අරමුණු කොටගත් සමෘද්ධි වැඩසටහනේ ක්‍රියාකාරිත්වයේ පවත්නා දුර්වලතාවයන් නිසා වැඩසටහන අසාර්ථක වී තිබේ. දරිද්‍රතාවය පිටුදැකීම සඳහා ඉලක්ක කණ්ඩායම් නිවැරදිව හඳුනා ගැනීම, දිළිඳුකම අනුව එකී කණ්ඩායම් වර්ගීකරණය කිරීම, එකී වර්ගීකරණයන් අනුව සහනාධාර ලබාදීම, දිළිඳු පුද්ගලයන් සමාන වෘත්තීන් අනුව කණ්ඩායම් ගතකරමින් ප්‍රජා සංවිධාන ජාලයක් ගොඩනැංවීම, ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයන්ගේ සෘජු මැදිහත්වීම තුළින් දිළිඳු පුද්ගලයන්ගේ ආයෝජන අවස්ථාවන් නංවාලීමට කටයුතු කිරීම, දිළිඳුකම පිටු දැකීමේ කෙටිකාලීන ප්‍රවේශයන්ය. අධ්‍යාපනය නංවාලීම, අධ්‍යාපන පහසුකම්වල විෂමතාවයන් අවම කිරීම, කෘෂි ක්ෂේත්‍රය නවීකරණය කිරීම, යටිතල පහසුකම් නංවාලීම, සනීපාරක්ෂක කටයුතු නංවාලීම, විරැකියාව අවම කිරීමේ වැඩසටහන හඳුන්වා දීම, පරිසරයේ ගුණාංග ආරක්ෂාවන අයුරින් සංවර්ධන ක්‍රමවේදයන් දියත් කිරීම, නිරෝගී මතු පරපුරක් බිහි කිරීම, දිළිඳුකම පිටුදැකීමේ දිගුකාලීන තිරසර ප්‍රවේශයන්ය.

---

දිළිඳුකම
තිරසර ප්‍රවේශයන්
ක්ෂුද්‍ර මූල්‍ය